# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2466/27 - 2025 දෙසැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2025.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී./2021(III)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය, 6 වන වගන්තියේ (ද) ඡේදය සහ 10 වන වගන්තියේ (4) වන උපවගන්තිය සමග කියවිය යුතු යථෝක්ත පනතේ 72 වන වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් සාදන ලද රීති.

**රේවන් වික්‍රමසූරිය,**
අධ්‍යක්ෂ ජනරාල් - කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව.

2025 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2025 අංක 01 දරන කොළඹ වරාය නගරය ප්‍රජා රීති ලෙස හැඳින්විය හැකිය.

2. මෙම රීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සභාධිපත්‍ය කොටස් හෝ පරිශ්‍රවල හිමිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට අදාළ විය යුතුය.

3. සභාධිපත්‍ය කොටස් හෝ පරිශ්‍රවල සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම එම සභාධිපත්‍ය කොටසේ හෝ පරිශ්‍රයේ භාවිතය සහ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් එම හිමිකරු හෝ පදිංචිකරු දරන ඕනෑම බලපත්‍රයක නියමයන් සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

4. යම් සභාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම 2023 ජුනි 2 වැනි දින අංක 2334/47 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන රෙගුලාසි) වල නිශ්චිතව දක්වා ඇති පරිදි එම සභාධිපත්‍ය කොටස හෝ පරිශ්‍රය එහි අවසරලත් භාවිතය සඳහාම භාවිත කරන බවට සහතික විය යුතුය.

1A - PG 7400 — 04 (2025/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. යම් සහාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම, ව්‍යාපාරික කටයුතු ඇතුළුව, එම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ ක්‍රියාකාරකම් සෑම විටම සාධාරණ සැලකිල්ලෙන් සහ කඩිසරව පවත්වාගෙන යන හෝ ඉටුකරන බවට සහතික විය යුතුය.

6. යම් සහාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම -

(අ) එවැනි සහාධිපත්‍ය කොටසක් හෝ පරිශ්‍රයක් සහ එහි ඇති ඕනෑම දේපළක් සෑම විටම ආරක්ෂිත සහ සුරක්ෂිත තත්ත්වයකින් පවත්වාගෙන යාමට ප්‍රයත්න දැරිය යුතුය; සහ

(ආ) මහජන සෞඛ්‍යය සහ ආරක්ෂාව, ගිනි ආරක්ෂාව සහ පොදු පරිශීලක පහසුකම්වලට අදාළ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් දේපළ කළමනාකරු විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූල විය යුතු වන්නේ ය.

7. (1) පොදු ප්‍රදේශ සහාධිපත්‍ය කොටස් හෝ පරිශ්‍රවල සියලුම හිමිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ භාවිතය සඳහා විය යුතු වන්නේ ය.

(2) පොදු ප්‍රදේශ පොදුවේ පරිහරණය කරන්නා වූ පහසුකම් විය යුතු අතර, යම් සහාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු වෙනත් පුද්ගලයෙකු එවැනි පොදු ප්‍රදේශ භාවිත කිරීම වැළැක්වීම නොකළ යුතු වන්නේය.

(3) යම් සහාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක කිසිදු හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු පොදු ප්‍රදේශවල කොටසක් වන්නා වූ කිසිදු ව්‍යුහයකට හානි කිරීම හෝ විකෘති කිරීම නොකළ යුතු වන්නේ ය.

8. (1) යම් සහාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ මාර්ගවල දක්වා ඇති වේග සීමාවන් පිළිපැදිය යුතු වන්නේ ය.

(2) යම් සහාධිපත්‍ය කොටසක හෝ පරිශ්‍රයක කිසිදු හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු වෙනත් ඕනෑම පුද්ගලයෙකුට අනතුරුදායක, සෝෂාකාරී හෝ කරදරකාරී අයුරකින් කිසිදු වාහනයක් ධාවනය නොකළ යුතු වන්නේ ය.

9. (1) සහාධිපත්‍ය බිම් කොටසක හෝ පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම තම වාහනය වාහන නැවැත්වීමේ අරමුණු සඳහා අවසර දී ඇති හෝ නියම කරන ලද ප්‍රදේශවල පමණක් ගාල් කළ යුතු වන්නේ ය.

(2) අනවසර හෝ නියම නොකරන ලද ප්‍රදේශයක නවතා ඇති යම් වාහනයක් කොමිෂන් සභාව හෝ දේපළ කළමනාකරු විසින් වාහනයේ හිමිකරු මත වන අවධානම සහ වියදමින් වහාම ඉවත් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(3) කොළඹ වරාය නගර බල ප්‍රදේශය තුළ නවතා ඇති යම් වාහනයක් එම වාහනයේ හිමිකරුගේ අවධානමක් සහ වගකීමක් පමණක්ම වන අතර, කොළඹ වරාය නගර බල ප්‍රදේශය තුළ නවතා ඇති යම් වාහනයක් හෝ එවැනි වාහනයක තබා ඇති යම් භාණ්ඩයක්, දෙයක් හෝ දේපළක් සඳහා කොමිෂන් සභාව හෝ දේපළ කළමනාකරු කිසිදු වගකීමක් නොදරනු ඇත.

10. මෙම රීති තුළ -

"පනත" යන්නෙන් අදහස් කරන්නේ 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතයි.

"කොමිෂන් සභාව" යන්නෙන් පනත යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ.

"පොදු ප්‍රදේශ" යන්නට පනතේ ඇති ආර්ථයම තිබිය යුතුයි;

"ප්‍රජා නීති" යන්නට පනතේ ඇති අර්ථයම තිබිය යුතුය; සහ

"දේපළ කළමනාකරු" යන්නෙන් අදහස් කරන්නේ පනතේ 59 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංස්ථාගත කර නම් කරන ලද සමාගමයි.

EOG 12 - 0062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.